**<u>රැකියා විරහිත උපාධිධාරීන් / ඩිප්ලෝමාධාරීන් රැකියාගත කිරීම - 2020 යටතේ බඳවාගත් උපාධිධාරීන් / ඩිප්ලෝමාධාරීන් ස්ථිර පදනමින්</u>**

**<u>බස්නාහිර පළාත් රාජ්‍ය සේවයට පත්කිරීමසඳහා මාර්ගගත ක්‍රමය ඔස්සේ අයදුම්කිරීමේදී අනුගමනය කළයුතු උපදෙස් මාලාව.</u>**

රැකියා විරහිත උපාධිධාරීන් / ඩිප්ලෝමාධාරීන් රැකියාගත කිරීම - 2020 වැඩසටහන යටතේ බඳවා ගන්නා ලද උපාධිධාරී අභ්‍යාසලාභීන් අතරින් බස්නාහිර පළාතේ සංවර්ධන නිලධාරී තනතුර සඳහා බඳවා ගැනීමට යෝජිත උපාධිධාරීන් / ඩිප්ලෝමාධාරීන් පහත දක්වා ඇති උපදෙස් පිළිපදිමින් අයදුම්පත පිරවිය යුතුය.

- පියවර 01- පළමුව ප්‍රධාන මෙනුවේ සඳහන් " අයදුම් කිරීම"යන මෙනුව තුල ඇති "අභ්‍යාසලාභී උපාධිධාරීන් සංවර්ධන නිලධාරී 111 ශ්‍රේණියට පත්කිරීම සඳහා අයදුම්පත් කැඳවීම" යන අතුරු මෙනුව තෝරා ගන්න.
- පියවර - 02 - ජාතික හැඳුන්ම්පත් අංකය යොමුකිරීමෙන් අනතුරුව SEARCH BUTTON එක තෝරන්න.
- පියවර - 03 - එවිට ඔබගේ තොරතුරු සහිතව දිස්වෙන වගුවෙහි ENTER DETAIL යන බොත්තම තෝරන්න.
- පියවර - 04 - ඉන්පසු දිස්වන තිරයේ සඳහන් වන තොරතුරු සම්පූර්ණ කිරීමෙන් අනතුරුව CLOSE යන බොත්තම තෝරන්න
- පියවර - 05 - ඔබ වෙත තවදුරටත් තොරතුරු ඇතුලත් කිරීමට ඇත්නම් UPLOAD යන බොත්තම මගින් ඇතුල් කළ හැකිය.
- පියවර - 06- යලිත් වරක් ජා.හැ.අං දිස්වන ප්‍රධාන මෙනුව වෙත පිවිස PRINT APPLICATION මගින් අයදුම්පත හා ආයතන ප්‍රධානියාගේ සහතිකය මුද්‍රණය කරන්න.
- පියවර 07 - නැවතත් එම මෙනුවටම පිවිස ATTACHED DOCUMENT යන බොත්තම වෙත පිවිසි පහත සඳහන් ලිපිලේඛන ස්කෑන් කර PDF පිටපත් ලෙස ගෙන UPLOAD කරන්න.

1. අයදුම්කරුගේ අත්සන සහිත අයදුම්පත 01-A- සිට 01-B දක්වා
2. සම්පූර්ණ කරන ලද ආයතන ප්‍රධානියාගේ සහතිකයෙහි <u>මුල් පිටපත</u> ( අයදුම්පතෙහි ඇමුණුම 02 –A හා 02 – B දක්වා)
3. උප්පැන්න සහතිකයේ සහ ජාතික හැඳුනුම්පතෙහි <u>සහතික කරන ලද</u> ඡායා පිටපත්
4. ආයතන ප්‍රධානියා විසින් <u>සහතික කරන ලද</u> අභ්‍යාසලාභී පත්වීම් ලිපියෙහි ඡායා පිටපතක්
5. උපාධි සහතිකයෙහි <u>සහතික කරන ලද</u> ඡායා පිටපත හා උපාධියට අදාළ තොරතුරු සහතිකය (DETAIL CERTIFICATE)<u>සහතික කරන ලද</u> ඡායා පිටපතක්
6. වසරක පුහුණුව සම්පූර්ණ කරන ලද බව දක්වන ආයතන ප්‍රධානියාගේ සහතිකයෙහි <u>මුල් පිටපත</u>
7. පදිංචිය තහවුරු කිරීම සඳහා වන ග්‍රාම නිලධාරී සහතිකයෙහි <u>මුල් පිටපත</u> (ඩී.එස් 04)

- පියවර - 08 - සියලුම ලිපිලේඛන UPLOAD කිරීමෙන් අනතුරුව CLOSE බොත්තම CLICK කර අයදුම් කිරීමේ කටයුතු අවසන් කරන්න.

මෙම සියලුම ලිපිලේඛන වෙබ් අඩවිය ඔස්සේ ඇතුළත් කිරීමෙන් අනතුරුව, Upload කරන ලද සියළු ලිපිලේඛනවල දක්වා ඇති පරිදි මුල් පිටපත් හා සත්‍ය පිටපත් එම පිළිවෙලටම සකසා **<u>අංක 204, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල යන ලිපිනයෙහි පිහිටි බස්නාහිර පළාත් ප්‍රධාන ලේකම් කාර්යාලය වෙත 2022.01.31</u>** දිනට පෙර පැමිණ හෝ ලියාපදිංචි තැපැල මගින් හෝ භාරදිය යුතුය.

සැ.යු - වෙබ් අඩවිය මගින් බාගත කරන ලද අයදුම්පතෙහි සංශෝධනය විය යුතු යම් කරුණක් වෙතොත් අදාළ කරුණ අයදුම්පතෙහි මුද්‍රිත පිටපතෙහි ඉදිරියේදි පැහැදිලිව තම අත් අකුරෙන් ලියා එම ස්ථානයේ තම කෙටි අත්සනින් සහතික කර දක්වා එවිය යුතුය.

**එමෙන්ම වෙබ් අඩවියෙහි සඳහන් අයදුම්පත පිරවීමේදී " සේවය කරන ස්ථානය" යන කොටසට ඔබ අනුයුක්ත කර ඇති ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සඳහන් කළ යුතු බව වැඩිදුරටත් දන්වමි.**

**<u>2022.01.03 දිනට වසරක සේවා කාලය සම්පූර්ණ කරන ලද අභ්‍යාසලාභීන් පමණක්</u>** ඉහත උපදෙස් පරිදි අයදුම්කළ යුතු අතර වසරක සේවා කාලය 2022.01.03 දිනට පසුව යෙදෙන දිනයක් වන සෑම අභ්‍යාසලාභීයකු සඳහාම ඉදිරි දිනයකදි පසුකාලීනව අයදුම්කිරිම සඳහා අවස්ථාව සලසා දෙනු ලැබේ.

තිලක් සෙනරත්
ලේකම්,
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
බස්නාහිර පළාත.
2022.01.20